# විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
## வெளிநாட்டு வளங்கள் திணைக்களம்
## Department of External Resources

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය (3 වැනි මහල), කොළඹ 00100, ශ්‍රී ලංකාව
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
செயலகம் (3 ஆம் மாடி), கொழும்பு 00100, இலங்கை
Ministry of Finance, Planning and Economic Development
The Secretariat (3rd Floor), Colombo 00100, Sri Lanka

**Website**: www.erd.gov.lk **e-mail:** info@erd.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: ER/AB/EV/02 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 18.08.2026 |

**ප්‍රවෘත්ති නිවේදනය**

**පශ්චාත් දිට්වා සුළි කුණාටු ප්‍රතිසංස්කරණ හා ජීවනෝපාය සහය ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් මූල්‍ය සහය**

**2026** සිට **2030** දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත පශ්චාත් දිට්වා සුළි කුණාටු ප්‍රතිසංස්කරණ හා ජීවනෝපාය සහය ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන **200** ක ණය මුදලක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා රජය ආසියානු සංවර්ධන බැංකුව **(ADB)** සමඟ සාකච්ඡා පවත්වන ලදී.

සුළි කුණාටුවෙන් හානි වූ මාර්ග දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන අයුරින් පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීම සිදුකරනු ඇත. එසේම, සුළි කුණාටුවෙන් හානි වූ වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම, බලපෑමට ලක් වූ පවුල් සඳහා කෘෂිකාර්මික ජීවනෝපාය සහාය ලබාදීම සහ නිවාස හානි වූ පවුල් සඳහා නිවාස ප්‍රතිසංස්කරණ ප්‍රදාන ලබාදීම සඳහා මෙම මූල්‍ය පහසුකම උපකාරී වනු ඇත.

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ විධායක ආයතනය ලෙස ක්‍රියා කරනු ඇත. තවද, ව්‍යාපෘතිය ප්‍රධාන සංරචක තුනකින් සමන්විත වන අතර ඒවා පහත සඳහන් ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

**සංරචකය 1** - සුළි කුණාටුවෙන් හානි වූ මාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය ( මාර්ග සංවර්ධන අධිකාරිය )
**සංරචකය 2** - සුළි කුණාටුවෙන් හානි වූ වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම (වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය)
**සංරචකය 3** - සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ පවුල්වල ජීවනෝපාය නගාසිටුවීම හා නිවාස යථා තත්ත්වයට පත් කිරීම (කෘෂිකාර්මික සහාය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ නිවාස සහාය සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය)

ඒ අනුව, අදාළ ණය ගිවිසුම් සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතා සහ ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් ශ්‍රී ලංකා නේවාසික අධ්‍යක්ෂිකා ෂැනන් කව්ලින් මහත්මිය විසින් **2026** අගෝස්තු **18** වන දින කොළඹ පිහිටි මහා භාණ්ඩාගාරයේ දී අත්සන් තබන ලදී.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
**2026** අගෝස්තු **18**


අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 94-11-2484693
කාර්යාලය / அலுவலகம் / Office: 94-11-2484500, 94-11-2484600
ෆැක්ස් අංකය / தொலை நகல் / Fax: 94-11-2447633, 94-11-2387153